ජනක සෞඛ්‍ය තොරතුරු කළමණාකරන පද්ධතිය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය - 2015

2015 වර්ෂයේ නිකුත් කරන ලද ජනක සෞඛ්‍ය තොරතුරු කළමණාකරන පද්ධතිය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ නැවත සංශෝධනය විය යුතු ස්ථාන කිපයක් ඇති බව හඳුනා ගෙන ඇත. එම සංශෝධනයන් පහත සඳහන් කරන අතර හඳුනා ගැනීම සඳහා මාතෘකාව, පිටු අංකය හා අදාල අංක හෝ සළකුණු සඳහන් කරනු ලැබේ.

පිටු අංක - 08

යෝග්‍යතා පවුල් පිළිබඳ ලේඛනය - සෞ. 526

- **යෝග්‍යතා පවුල යනු**

විවාහක (නීතියෙන් හෝ වාරිත්‍රානුකූලව) අවුරුදු 15-49 අතර වයසැති ස්ත්‍රියක් සිටින පවුල් ඒකකයක් හෝ වයස අවුරුදු 5 ට අඩු දරුවකු සිටින පවුල් ඒකකයකි. එමෙන්ම පවුලක අවිවාහක ස්ත්‍රියක් ගැබ්ගත් අවස්ථාවකදී එම ස්ත්‍රියද වයස් කාණ්ඩය නොසලකා යෝග්‍යතා පවුලක් සේද, කුමන වයස් සීමාවක සිටියද ගර්භණී මවක් සිටින පවුල් ඒකකයද, කාන්තාවගේ වයස අවු 15 ට අඩු වුවද යුවලක් එක්ව ජීවත් වන්නේ නම් එම යුවලද යෝග්‍යතා පවුලක් සේ සැලකිය යුතුය. වැන්දඹු (ස්වාමියා මිය ගිය) දික්කසාද වූ (නීතියෙන් ස්වාමියාගෙන් වෙන්වූ) හා නීතියෙන් වෙන් නොවී ස්වාමියාගෙන් වෙන් වී ජීවත් වන කාන්තාවන්ද යෝග්‍යතා පවුලක්සේ සලකනු ලැබේ.

යෝග්‍යතා පවුල් කාණ්ඩ සඳහා කේත අක්ෂර

කේත අක්ෂරය "B" පහත සඳහන් අයුරු වෙනස් විය යුතුය.

B – කුමන වයස් සීමාවක සිටියද ගර්භණී මවක් සිටින පවුල් ඒකකය (A හා D අක්ෂර වලට අදාල යෝග්‍යතා පවුල් කාණ්ඩ හැර)

ලේඛනය පවත්වා ගත යුතු අන්දම

- සෑම ගමක්ම/නාගරික කොට්ඨාශයක්ම කේත අකුරකින් හැඳින්විය යුතු අතර ඒ සඳහා වෙන් වෙන් වශයෙන් යෝග්‍යතා පවුල් ලේඛන තබා ගත යුතුය. ගම් කුඩා නම්, (පවුල් 50 ට අඩු නම්) ගම් දෙකක් සඳහා එක යෝග්‍යතා පවුල් ලේඛනයක් තබා ගත හැකිය. එසේ කිරීමේදී ලේඛනය දෙකට බෙදාගෙන භාගයක් එක් ගමක් සඳහාද, ඉතිරි භාගය අනිත් ගම සඳහාද වෙන් කර ගත යුතු අතර ගම් දෙක වෙන වෙනම කේත අකුරු දෙකකින් හැඳින් විය යුතුය.

පිටු අංක - 10 (දෙවන "තිත")

එමෙන්ම ලේඛනයට ගත යුත්තේ ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති පවුල් (එනම් භාරයට ගත යුතු පවුල්) පමණි. පිට පළාතකින් පැමිණි පවුලක් ස්ථිර පදිංචි ලෙස තීරණය කිරීමට පහත කරුණු සැළකිල්ලට ගත හැකිය.

- ❖ ස්ථිර පදිංචියට පැමිණි බව පවසා සිටීම
- ❖ බඩු බාහිරාදිය රැගෙන පැමිණ සිටීම
- ❖ කුලී නිවාසයකට පැමිණ සිටීම
- ❖ පදිංචිව සිටීමට බලාපොරොත්තු වන කාලය හෝ දැනට පදිංචි වී සිටි කාලය මාස 6කට වඩා වැඩි වීම

ඉහත කරුණු ස්ථිර නිර්නායක නොවන නමුත් ස්ථිර පදිංචිය තීරණය කිරීම සඳහා උපයෝගි කරගත හැකිය.

- පිට පළාතකින් පැමිණි පවුලක් ස්ථිර පදිංචියට පැමිණියා සේ සලකා යෝග්‍යතා පවුල් ලේඛනයේ ලියාපදිංචි කරන්නේ නම්, ඒ බව එම පවුල කලින් පදිංචිව සිටි ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට, තම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හරහා ලිඛිතව දැන්විය යුතුය.

- එමෙන්ම තමාගේ යෝග්‍යතා පවුල් ලේඛනයේ ලියාපදිංචි පවුලක් ස්ථිරව පළාත හැර යන විට, ලේඛනයේ එම පවුලට අදාල තීරුව රතු ඉරකින් කපා දමා වෙනත් කරුණු තිරුවේ පළාත හැරගිය බව සඳහන් කරන්න. . එම පවුල පදිංචියට යන ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට, තම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හරහා ලිඛිතව දැනුම් දිය යුතුය. එසේම ස්ථිරව පළාත හැර ගිය පවුලක් පසු කාලීනව නැවත ස්ථිර පදිංචියට පැමිණිය හොත් යෝග්‍යතා පවුල් ලේඛනයේ අළුත් අංකයකින් ලියාපදිංචි කළ යුතුයි.

පිටු අංක - 10 (තුන්වන වන තිත සඳහා මෙම කොටසද ඇතුළත් විය යුතුය.)

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශ බෙදා වෙන් කිරීමේදී නව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශයට අයත් වූ සේවාලාභීන් අදාල ලේඛන වලින් පළාත හැර ගියා සේ කපා ඉවත් කළ යුතුය. නව ක්ෂේත්‍රයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි විසින් එම සේවාලාභීන් අදාල ලේඛනවල අළුතින් ලියාපදිංචි කළ යුතුය. යෝග්‍යතා පවුල් සඳහා අදාළ ගම් අනුව අළුතින් ලියාපදිංචි අංක ලබා දිය යුතුය. ගර්භණී මව්වරු නව ක්ෂේත්‍රයට ස්ථිර පදිංචිය සඳහා ලියාපදිංචි වී පිටින් පැමිණි මව්වරුසේ සේ සලකා පි. පැ. අංකයකින් ගර්භණී මව්වරුන්ගේ ලේඛනයේ අග කොටසේ ලියාපදිංචි කළ යුතුය. උපත් හා ප්‍රතිශක්තිකරණ ලේඛනයේද අදාල මාසයට අනුව ළදරු ළමා ලියාපදිංචිය සිදු කළ යුතු වේ.

පිටු අංක - 10 (හතරවන "තිත" සඳහා මෙම කොටස ඇතුළත් විය යුතුයි)

- යෝග්‍යතා පවුල් සඳහා (විශේෂිත සංරක්ෂණ සේවාවන් සඳහා නියමිත ගෘහ පිවිසීම් හැරුනු විට) අවම වශයෙන් මාස 6කට වරක්වත් ගෘහ පිවිසීම් කළ යුතුය.

පිටු අංක - 10 හතරවන "තිත", පස් වන" තිත" ලෙස වෙනස් විය යුතුයි

- අවුරුදු 5 කට වරක් මෙම ලේඛනය නැවත අළුතින් ලිවිය යුතුය. (renewal)

❖ මෙම පිටුවෙහි "යතාවත් කිරීම" යනුවෙන් සඳහන් කර ඇති තැන් "නැවත ලිවීමේදී" ලෙස වෙනස් විය යුතුයි.

පිටු අංක 13 (හතරවන තීරුව)

වෙනත් කරුණු -

- මදසරුභාවයෙන් පෙලෙන යුවල් පිළිබඳ

මදසරුභාවය සහිත යුවලක් යනු මාස 12ක් හෝ ඊට වැඩි කාලයක් තුළ සතියකට වාර 2-3 ක් වත් උපත් පාලන ක්‍රමයක් භාවිතයෙන් තොරව, ලිංගික සබඳතාවන් පවත්වා ඇති නමුත් දරු පිළිසිඳ ගැනීමක් සිදු නොවූ යුවල්ය.

මදසරුභාවය දෙයාකාරයකට අර්ථ දැක්විය හැකිය.

ප්‍රාථමික හා ද්විතියික මදසරුභාවය :-

- ♦ දරු පිළිසිඳ ගැනීමක් පිළිබඳ පූර්ව ඉතිහාසයක් නොමැති මදසරුභාවයෙන් පෙළෙන යුවලක් ප්‍රාථමික මදසරුභාවය සහිත යුවලක් වේ.
- ♦ පෙර දරු පිළිසිඳ ගැනීමක් සිදු වුවද දෙවන වර දරු පිළිසිඳ ගැනීමක් **බලාපොරොත්තු වී** මාස 12ක් ඇතුළත දරු පිළිසිඳ ගැනීමක් සිදු නොවූ යුවලක් ද්විතියික මදසරුභාවය සහිත යුවලක් ලෙස සැලකේ.

පිටු අංක 14

නව යොවුන් දරුවන් (අවු. 10-19 අතර)

අවුරුදු 10-19 දක්වා වයස් කාණ්ඩයට අයත් දරුවන් නව යෞවනයින් සේ සැලකේ.

- තම ප්‍රදේශයේ සිටින නව යෞවනයින් හඳුනා ගෙන ලියාපදිංචි කළ යුතු වේ. යෝග්‍යතා පවුල් තුළ සිටින නව යෞවනයින් ගණන ලේඛනයේ අදාල තීරුවේ යෝග්‍යතා පවුලට අදාලව ඔවුන්ගේ උපන් වර්ෂය සහ ස්ත්‍රී පුරුෂභාවය පහත පරිදි සටහන් කරන්න.

  උදා: F/2005 M/2002

පිටු අංක 16

ආ. කලින් සිට පළාතෙහි ලියාපදිංචි කර ඇත්නම් ඒ මව, යෝග්‍යතා පවුලක් ලෙස ලියාපදිංචි කර ගර්භණී නාම ලේඛනයේ පිටින් පැමිණි මව්වරු සඳහා වෙන්කර ඇති කොටසෙහි (ප්‍රසූතියෙන් පසු ක්ෂේත්‍රයට පිටින් පැමිණෙන පසු ප්‍රසව මව්වරු ලියාපදිංචි කිරීමේ කොටසට පෙර පිටුවල) ලියාපදිංචි කළ යුතුයි. ඒ මවගේ ලියාපදිංචි අංකය වනුයේ;

මෙම ගමේ යෝග්‍යතා පවුල් ලේඛනයේ හැඳින්වීමේ අංකය / පිටින් පැමිණි මව්වරුන්ගේ කොටසේ පිළිවෙලින් එන අංකය.

උදා : D/95/පි. පැ.35

මෙසේ කරන්නේ මේ මව දෙවරක් ලියාපදිංචි වීමක් ලෙස වාර්තා වීම වැලැක්වීම සඳහාය.

සැ: යු: - 1). තම ප්‍රදේශයේ සිට ස්ථිරව පළාත හැරගිය ලියාපදිංචි කරන ලද ගර්භණී මවක් පසුව නැවත තම ප්‍රදේශයට ස්ථිර පදිංචියට පැමිණි විට එම මව

- යෝග්‍යතා පවුල් ලේඛනයේ අළුතින් ලියාපදිංචි කළ යුතුය.
- ගර්භණී නාම ලේඛනයේ පිටින් පැමිණි ගර්භණී මවිවරු ලියාපදිංචිකරන කොටසේ ලියාපදිංචි කළ යුතුය.
- එම මවගේ ලියාපදිංචි අංකය වනුයේ

යෝග්‍යතා පවුල් ලේඛනයේ හැඳින්වීමේ අංකය/ පිටින් පැමිණි ගර්භණී මවිවරු ලියාපදිංචිකරන කොටසේ පිළිවෙලින් එන අංකය

2). පිට පළාතක තාවකාලිකව පදිංචිව සිට පි.පැ. අංකයක් සහිතව තම ස්ථිර පළාතට ගර්භණී මවක් පැමිණියේ නම් එම මව

- ගර්භණී නාම ලේඛනයේ පිටින් පැමිණි ගර්භණී මවිවරු ලියාපදිංචි කරන කොටසේ ලියාපදිංචි කළ යුතුය. එසේ කරනුයේ මෙම මව දෙවරක් ලියාපදිංචි ගණනට එකතු වන බැවිනි.
- එම මවගේ ලියාපදිංචි අංකය වනුයේ

යෝග්‍යතා පවුල් ලේඛනයේ හැඳින්වීමේ අංකය/ පිටින් පැමිණි ගර්භණී මවිවරු ලියාපදිංචිකරන කොටසේ පිළිවෙලින් එන අංකය

3). පි. පැ. අංකය සහිත මවක් ක්ෂේත්‍රයේ දිගටම සිටිය හොත්

- පිට පළාතකින් පැමිණි යෝග්‍යතා පවුලක් ස්ථිර පදිංචි ලෙස තීරණය කිරීමේදී භාවිතා කරන නිර්නායක සලකා බලා එම මව ස්ථිර පදිංචි පවුලක් සේ යෝග්‍යතා පවුල් ලේඛනයේ ලියාපදිංචි කර එම මව තම භාරයට ගත හැකිවේ.
- එම මව දැනටමත් ලියාපදිංචි මවිවරු ගණනට එකතු වී ඇති බැවින් පි. පැ. අංකයම භාවිතා කළ යුතු වන අතර එම අංකයට ඉදිරියෙන් යෝග්‍යතා අංකය යෙදිය හැකිවේ.
- එම මවගේ ලියාපදිංචි අංකය වනුයේ -

  යෝග්‍යතා පවුල් ලේඛනයේ හැඳින්වීමේ අංකය / පි. පැ. අංකය

4). මවක් අවුරුදු 49 ට පසු නැවත ගර්භණීභාවයට පත් වුවහොත් එම මව

- යෝග්‍යතා පවුල් කාණ්ඩය "B" යටතේ (කුමන වයස් සීමාවක සිටියද ගර්භණී මවක් සිටින පවුල් ඒකකය) යෝග්‍යතා පවුලක් ලෙස ලියාපදිංචි කළ යුතුය.
- ගර්භණී මවක් ලෙස ගර්භණී නාම ලේඛනයේ මුල් කොටසේ ලියාපදිංචි කළ යුතුය.

පිටු අංක 18 - අංක 24 තිරුව

මෙම තිරුවේ මාතෘකාව **"උපත් හා ප්‍රතිශක්තිකරණ ලේඛනයේ අංකය හා ලි.ප. කළ දිනය"** ලෙසින් වෙනස් විය යුතුයි.

පිටු අංක 20 - අංක 13, 14 සහ 15 තිරු පහත පරිදි වෙනස් විය යුතුයි.

13. රුධිර සිනි මට්ටම සති 12 ට පෙර හා සති 24-28 කාලයේ පරීක්ෂා කර අදාල කොටු වල **අගය** සටහන් කරන්න.

14. හිමෝග්ලොබින් මට්ටම සති 12 ට පෙර හා සති 26-28 පරීක්ෂා කර අදාල කොටු වල **අගය** සටහන් කරන්න.

15. රුධිර ගණය පරීක්ෂා කළ වාර්තා තිබේ නම් රුධිර ගණය කොටුව තුළ සටහන් කරන්න. නැතිනම් කොටුව හිස්ව තබා පරීක්ෂණ වාර්තා ලැබුණු පසු සටහන් කරන්න.

17. HIV පූර්ව පරීක්ෂාව - HIV පූර්ව පරීක්ෂාව සඳහා **රුධිරය ලබා ගත්** මවිවරු ගණන සටහන් කරන්න.

පිටු අංක 22

❖ **ක්ෂේත්‍රයට පිටින් පැමිණෙන පසු ප්‍රසව මවිවරුන්ට සංරක්ෂණය ලබා දීම**

ස්ථිරව හෝ තාවකාලිකව පිටින් පැමිණෙන පසු ප්‍රසව මවිවරුන් ලියාපදිංචි කිරීම සඳහා ගර්භණී නාම ලේඛනයේ අග පිටු වෙන් කර ඇත. මෙම මවිවරුන් සඳහා පහත පරිදි ලියාපදිංචි අංක ලබා දිය යුතුවේ.

උදා-: තාවකාලික පදිංචියට පැමිණි මවිවරු සඳහා - A/X/05

A – පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශයේ මව පදිංචි ගමට අදාල කේත අංකය

X – ප්‍රසූතයෙන් පසු පැමිණි බව හඳුනා ගන්නා සංකේතය

05 - ක්ෂේත්‍රයට පිටින් පැමිණෙන පසු ප්‍රසව මවිවරුන්ට සංරක්ෂණය ලබා දීම යටතේ පිළිවෙලින් එන අංකය.

උදා:- ස්ථිර පදිංචියට පැමිණි මවිවරු සඳහා - A/26/X/05

A/26 – යෝග්‍යතා පවුල් ලේඛනයේ අංකය

X – ප්‍රසූතයෙන් පසු පැමිණි බව හඳුනා ගන්නා සංකේතය

05 - ක්ෂේත්‍රයට පිටින් පැමිණෙන පසු ප්‍රසව මවිවරුන්ට සංරක්ෂණය ලබා දීම යටතේ පිළිවෙලින් එන අංකය.

උපත් හා ප්‍රතිශක්තිකරණ ලේඛනය - ජ. පි. අයි. 3/79

පිටු අංක 23

අංක 4 පහත පරිදි වෙනස් විය යුතුයි.

4. මෙම ලේඛනය දරුවකුගේ **වයස අවු 19 වන තෙක්** පවත්වා ගත යුතුය. පාසල් දරුවන්ගේ නව එන්නත් සටහනද මෙහි ඇතුළත් කර ඇත.

1. අනුක්‍රමික අංකය යටතේ

තාවකාලිකව පදිංචි ළදරුවන් සඳහා තාවකාලික ලියාපදිංචි අංකයක් ලබා දිය යුතුය.

මෙහිදී උපත් හා ප්‍රතිශක්තිකරණ ලේඛනයේ අවසාන අංකය 05/08/13 නම් ඊ ලඟට ලියාපදිංචි කරන්නේ තාවකාලික දරුවෙකු නම් ඔහුගේ ලියාපදිංචි අංකය වනුයේ 05/08/13/A වශයෙනි. තාවකාලිකව පැමිණි දරුවන් කිපදෙනෙක් එම මාසයේම සිටින විට B,C,D ආදී වශයෙන් අක්ෂරය වෙනස් කර අංකය ලබා දෙන්න. ඊට පසුව **ලියාපදිංචි කරන්නේ** ස්ථිර පදිංචි දරුවෙකු නම් එයට අදාල ස්ථිර අංකය ලබා දෙන්න.

පිටු අංක - 26

පළමුවන කොටුව

උදා : (1). අවසන් වරට ලියාපදිංචි කළ ස්ථිර පදිංචි දරුවාගේ අංකය - 05/08/13

ඉන්පසුව ලියාපදිංචි වන තාවකාලිකව පදිංචි දරුවාගේ අංකය - 05/08/13 A

ඉන්පසුව ලියාපදිංචි වන ස්ථිර පදිංචි දරුවාගේ අංකය - 06/08/13

ඉන්පසුව ලියාපදිංචි වන තාවකාලිකව පදිංචි දරුවාගේ අංකය - 06/08/13 A

ඉන්පසුව ලියාපදිංචි වන තාවකාලිකව පදිංචි දරුවාගේ අංකය - 06/08/13 B

ඉන්පසුව ලියාපදිංචි වන ස්ථිර පදිංචි දරුවාගේ අංකය - 07/08/13

අදාළ මාසයේ උපත් හා ප්‍රතිශක්තිකරණ ලේඛනයේ පළමුව ලියාපදිංචි කරන්නේ තාවකාලිකව පැමිණි දරුවෙක් නම් පහත පරිදි ලියාපදිංචි අංක ලබා දිය යුතුය.

උදා : (2). මාසයේ පළමුව ලියාපදිංචි කරන තාවකාලිකව පදිංචි දරුවාගේ අංකය - 01/09/13 A

ඉන්පසුව ලියාපදිංචි වන ස්ථිර පදිංචි දරුවාගේ අංකය - 01/09/13

ඉන්පසුව ලියාපදිංචි වන තාවකාලිකව පදිංචි දරුවාගේ අංකය - 01/09/13 B

ඉන්පසුව ලියාපදිංචි වන ස්ථිර පදිංචි දරුවාගේ අංකය - 02/09/13

- තාවකාලිකව ලියාපදිංචි කළ දරුවා පළාත හැරයන විට, ඒ බව වෙනත් කරුණු යටතේ සඳහන් කරන්න.
- එසේම ස්ථිර පදිංචි (භාරයේ සිටි) දරුවෙකුද, ස්ථිරව පළාත හැරයන විට ඒ බව වෙනත් කරුණු යටතේ සඳහන් කරන්න. එම දරුවාගේ විස්තර සහිත තිරුව රතු ඉරකින් හරහට කපා දැමීමෙන් භාරයේ සිටින දරුවන් ගණනය කිරීම පහසු වනු ඇත.
- තාවකාලිකව ලියාපදිංචි කරන ලද ළදරුවෙකුට වයස අවුරුද්දද ඉක්මවන විටත් ස්ථිර පදිංචිය සඳහා නොගියේ නම් එම දරුවා සපිවි උපත් ස්ථිර දෙවනවර කොටසට ඇතුළත් කර, ළදරු ලියාපදිංචි ගණනටද, එකතු කර ගත යුතුවේ. එමෙන්ම ස්ථිර පදිංචි පවුලක් ලෙස සලකන්නේ නම්, එසේ සලකන අවස්ථාවේදි යෝග්‍යතා පවුල් ලේඛනයේ ලියාපදිංචි කළ යුතුවේ.

9. ලියාපදිංචි කාණ්ඩය - **ප්‍රදේශයේ ස්ථිර පදිංචි මවකගේ දරුවා** ලියාපදිංචිය සිදු කරන ලද්දේ උපතේ සිට මාස තුනක් ඇතුළත නම් "B" අකුරද මාස තුනකට පසුව නම් "L" අකුරද ප්‍රදේශයට පිටින් පැමිණි දරුවෙකු නම් "O" අකුරද සටහන් කරන්න.

පිටු අංක 29 පහත පරිදි සංශෝධනය වේ. (ගර්භණී සටහන්පත අංක. 512 A සහ B)

- ශරීර ස්කන්ධ දර්ශකය - උස (මීටර්) බර (කි.ග්‍රෑ.) වලින් මැන පහත පරිදි ශරීර ස්කන්ධ දර්ශකය ගණනය කර සටහන් කරන්න

  ශරීර ස්කන්ධ දර්ශකය - $\frac{\text{බර (kg)}}{\text{උස}^2 \ (\text{m}^2)}$

- වයස - මවගේ සම්පූර්ණ කළ වයස හෝ උපන් දිනය ලියන්න

පිටු අංක 34 (ගර්භණී සටහන්පත අංක. 512 A සහ B)

- ෆෝලික් අම්ලය ගන්නේද යන වග - ෆෝලික් අම්ලය පෙති **පිළිසිඳ ගැනීමට මාස 3කට පෙර සිට ලබා ගන්නේ නම් "ඔව්" යනුවෙන්ද, එසේ නොමැති නම් "නැත" යනුවෙන්ද** කොටුවෙහි සඳහන් කරන්න.

පිටු අංක 40

➢ දන්ත සංරක්ෂණය - දන්ත ගැටළු ඇති කාන්තාවන් දන්ත සායනයට යොමු කිරීමේදී ගර්භණී සටහන් පතෙහි (සෞ. 512 A) යොමු කළ දිනය යටතේ, **දන්ත සායනය පැවැත්වෙන දිනය** සඳහන් කරන්න.

පිටු අංක 41 - (ගර්භණී සටහන්පත සෞ. 512 A සහ B)
පූර්ව ප්‍රසව සැලසුම

➢ සායනයට පැමිණිය යුතු දිනය - ඊළඟ සායනයට පැමිණිය යුතු දිනය සටහන් කිරීමේදී ගර්භණී කාන්තාව සමඟ සාකච්ඡා කර යොදා ගන්න. ඇය මෙම සායනයට හැර වෙනත් රජයේ පූර්ව ප්‍රසව සායන වලට සහභාගි වන්නේ නම් එම දිනද, සලකා බලා නැවත සායනයට පැමිණිය යුතු දිනය ලබා දෙන්න. හැකි තරම් දුරට එකම සේවාව එකම කාල සීමාවකදි රජයේ තැන් කිහිපයකින් ලබා ගැනීම වළක්වන්න.

- **සෞ. 512 - B**

තම ක්ෂේත්‍රයට ස්ථිරව හෝ තාවකාලිකව පිටින් පැමිණෙන පූර්ව ප්‍රසව මව්වරුන්ට සහ පසු ප්‍රසව මව්වරුන්ට ගර්භණී සටහන්පත සෞ. 512 -B කාඩ් පතක් නිකුත් කළ යුතුය. ගර්භණී සටහන්පත් (සෞ. 512 -B කාඩ්පත්) අවසන් වී ඇති අවස්ථාවක එහි ජායා පිටපතක් හෝ ලබා දීමට කටයුතු කළ යුතුය.

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ දින සටහන් පොත - සෞ. - 511

පිටු අංක - 42

පහත සඳහන් විස්තරය තුන්වන පේදය ලෙස සැලකිය යුතුය.

➢ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් ස්ථාන මාරු වී හෝ විශ්‍රාම යාමේදී දින පොත කාර්යාලයේ තබා යා යුතුය.

➢ ගෘහ පිවිසිමි සඳහා යාමට පෙර යෝග්‍යතා පවුල් ලේඛනයේ අවසාන අංකය, ගර්භණී මව්වරුන්ගේ ලේඛනයේ අවසාන අංකය, උපත් හා ප්‍රතිශක්තිකරණ ලේඛනයේ අදාළ මාසයේ අවසාන අංකය සහ නව යෞවනයින් සඳහා අවසාන තාවකාලික සහ ස්ථිර ලියා පදිංචි අංක දිනපොතේ පහසු තැනක සඳහන් කරගෙන යා යුතු වේ.

ගෘහ පිවිසිමි සහ යතාවත් කිරීම් යටතේ යෝග්‍යතා පවුල් මෙසේ වෙනස් විය යුතුය.

(1 වන කොටුව)

ප්‍රථම ගර්භයට පෙර - නවක විවාහපත් **හෝ** ප්‍රථම ගර්භණීභාවයට පෙර යෝග්‍යතා පවුල් ලේඛනයේ ලියාපදිංචි කරන ලද යුවල් මෙම කාණ්ඩයට අයත් වේ.

(4වන කොටුව)

❖ මෙම කොටුවේ **"දෙවන හා තෙවන තිත"** සැළකිල්ලට නොගත යුතු වේ.

- පළමු වරට යෝග්‍යතා පවුල් ලියාපදිංචි කිරීමේදී, යෝග්‍යතා අංකය අළුත් තිරුවේ සටහන් කරන්න. උදා: A/420

- යෝග්‍යතා පවුල් සඳහා නැවත ගෘහ පිවිසීම් කිරීමේදී පරණ තිරුවේ අදාළ යෝග්‍යතා අංකය සඳහන් කරන්න.

- ලේඛනයෙන් ඉවත් කරන යෝග්‍යතා පවුල් වල යෝග්‍යතා අංකය "ඉවත් කරන ලද" තිරුවේ සඳහන් කරන්න. පළාත හැරයාමේදී, යෝග්‍යතා පවුල තාවකාලිකව පළාත හැරයන්නේ නම් "T" අක්ෂරයද ස්ථිරව පළාත හැරයන්නේ නම් "P" අක්ෂරයද, අදාළ යෝග්‍යතා අංකය සමග "ඉවත් කරන ලද" තිරුවේ සඳහන් කරන්න.

උදා :- තාවකාලිකව පළාත හැරයන්නේ නම් - A/520- T
ස්ථිරව පළාත හැරයන්නේ නම් - A/520- P

පූර්ව ප්‍රසව

- පූර්ව ප්‍රසව මව්වරුන් සඳහා පළමු වරට ගෘහ පිවිසීමක් කළ විට අළුත් තිරුවේත් නැවත කරන ලද ගෘහ පිවිසීම් පරණ තිරුවේත් ගර්භණී මවගේ ලියාපදිංචි අංකයේ අග ඇති අනුක්‍රමික අංකය යොදා සටහන් කරන්න.

  උදා:- " 125 " - මෙහිදී ගෘහ පිවිසීම සහ ලියාපදිංචිය යන දෙකම සිදුවේ.

- වෙනත් ස්ථානයකදී (ඖෂධාගාර, කාර්යාලය වැනි) පූර්ව ප්‍රසව මවක් ලියාපදිංචි කල විට (ගෘහ පිවිසීමක් නොමැතිව) මවගේ ලියාපදිංචි අංකයේ අග ඇති අනුක්‍රමික අංකය සමඟ R අක්ෂරය යොදා අළුත් තිරුවේ සටහන් කරන්න.

  උදා:- 120 - R මෙහිදී සිදු වන්නේ අළුතින් ලියාපදිංචිය පමණි.

- වෙනත් ස්ථානයකදී, කලින් ලියාපදිංචි කරන ලද පූර්ව ප්‍රසව මවක් සඳහා පළමු වරට ගෘහ පිවිසීමක් සිදු කලවිට මවගේ ලියාපදිංචි අංකයේ අග ඇති අනුක්‍රමික අංකය සමඟ V අක්ෂරය යොදා අළුත් තිරුවේ සටහන් කරන්න.

  උදා:- 135-V මෙහිදී සිදු වන්නේ පළමු වරට ගෘහ පිවිසීම පමණි.

- පූර්ව ප්‍රසව මව්වරු පළාත හැර යාමේදී තාවකාලිකව පළාත හැරයන්නේ නම් "T" අක්ෂරයද ස්ථිරව පළාත හැරයන්නේ නම් "P" අක්ෂරයද මවගේ ලියාපදිංචි අංකයේ අග ඇති අනුක්‍රමික අංකය සමඟ ඉවත් කරන ලද, තිරුවේ සඳහන් කරන්න.

උදා :- තාවකාලිකව පළාත හැරයන්නේ නම් - 120- T
ස්ථිරව පළාත හැරයන්නේ නම් - 138- P

පිටු අංක - 43

❖ දින සටහන් පොතෙහි පූර්ව ප්‍රසව මව්වරු, පසු ප්‍රසව මව්වරු, හා ප්‍රසූත පිළිබඳ සටහන් තැබීමේදී ගර්භණී මව්වරුන්ගේ ලේඛනයේ ලියාපදිංචි අංකයේ අග ඇති අනුක්‍රමික අංකය යොදන්න.
උදා : මවගේ කාඩ් පතෙහි මවට දී ඇති ලියාපදිංචි අංකය B/20/110 නම්, 110 අදාළ කොටුවේ සටහන් කරන්න.

❖ තම ක්ෂේත්‍රයට පිටින් පැමිණි තාවකාලික නව ජන්මයින් පිළිබඳ දින පොතේ සටහන් තැබීමේදී ඔවුන්ට යෝග්‍යතා අංකයක් නොමැති බැවින් උපත් හා ප්‍රතිශක්තිකරණ ලේඛනයේ අංකය සටහන් කරන්න.

❖ කුඩා දරුවන් (අවු: 1-2) සහ පෙර පාසල් දරුවන් (අවු: 2-5) සඳහා ගෘහ පිවිසිම් හෝ සායනික පැමිණීම් "අළුත්" ලෙස හඳුන්වන්නේ එම වයස් කාණ්ඩය ඇතුළතදී පළමු වරට සිදු කරන ලද ගෘහ පිවිසිම හෝ සායනික පැමිණීම වේ.

උදා :- ළදරුවකු අවුරුද්ද ඉක්මවූ පසු කුඩා දරුවෙකු (අවු: 1-2) වේ. එම කුඩා දරුවා පළමු වරට සායනයට පැමිණියේ නම්, කුඩා දරුවන් (අවු: 1-2) "අළුත්" යටතේ සටහන් කළ යුතුවේ. එමෙන්ම ගෘහ පිවිසිම් වලදීද පළමු වරට කරන ලද ගෘහ පිවිසිම "අළුත්" යටතේ සටහන් කළ යුතුවේ.

කුඩා දරුවා අවුරුදු දෙක ඉක්මවූ විට පෙර පාසල් දරුවෙකු (අවු: 2-5) වේ. එම පෙර පාසල් දරුවා පළමු වරට සායනයට පැමිණියේ නම්, පෙර පාසල් දරුවන් (අවු: 2-5) "අළුත්" යටතේ සටහන් කළ යුතුවේ. එමෙන්ම ගෘහ පිවිසිම් වලදීද පළමු වරට කරන ලද ගෘහ පිවිසිම "අළුත්" යටතේ සටහන් කළ යුතුවේ.

පිටු අංක - 43 හා 45 (පවුල් සැලසුම්)

උදා: 1. යෝග්‍යතා අංකය B/80 වන ලුපයක් තැන්පත් කර ඇති ප්‍රතිග්‍රාහිකාවක් සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය කරන අනු ගමනකදී" B/80 -L" ලෙස සඳහන් කරන්න.

2. ගිලින පෙති භාවිතා කරන යෝග්‍යතා අංකය B/20 වන ප්‍රතිග්‍රාහිකාවක් සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය කරන අනු ගමනකදී පෙති පැකට් 2ක් ලබා දුන්නේ නම් B/20- P (2) ලෙස සඳහන් කරන්න.

3. කොන්ඩම් භාවිතා කරන යෝග්‍යතා අංකය B/32 වන යෝග්‍යතා පවුලක ප්‍රතිග්‍රාහිකාවක් සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය කරන අනු ගමනකදී කොන්ඩම් 10ක් ලබා දුන්නේ නම් B/32 - C (10) ලෙස සඳහන් කරන්න.

පිටු අංක - 45 නව යෞවනයන් - ස්ථිර

තම ක්ෂේත්‍රයේ ස්ථිර පදිංචි නව යෞවනයන් සඳහා කරන ලද ගෘහ පිවිසීම් අළුත් හා පරණ වශයෙන් අදාල ලියාපදිංචි අංක සමග සටහන් කරන්න. එකම යෝග්‍යතා පවුලක් තුළ නව යෞවනයන් කිපදෙනෙක් ඇති විට යෝග්‍යතා අංකය ඉදිරියෙන් වරහන් තුළ නව යෞවනයන් ගණන දමන්න.

උදා :- B/26 යෝග්‍යතා පවුලේ නව යෞවනයන් දෙදෙනෙක් සිටී නම් B/26 (2) ලෙස සඳහන් කරන්න.

පිටු අංක - 45 සජීවී උපත් /ස්ථිර/ පළමුවර

තමා භාරයේ සිටින ස්ථිර පදිංචි මවකගේ සජීවී උපත් ප්‍රථම වරට ලියාපදිංචි කරන්නේ නම් එය සජීවී උපත් ස්ථිර පළමුවර කොටසට, මවගේ ලියාපදිංචි අංකයේ මුල් කොටස එනම් යෝග්‍යතා අංකයෙන් සඳහන් කරන්න. එමෙන්ම ප්‍රසූතියෙන් පසු පිටතින් ස්ථිර පදිංචියට පැමිණි මව්වරුන්ගේ සජීවී උපත් ඔවුන්ට ලබා දෙන පසු ප්‍රසව අංකයෙන් සඳහන් කරන්න.

පිටු අංක - 45 සජීවී උපත් /ස්ථිර/ දෙවනවර

සැ.යු: තම ප්‍රදේශයේ සිටි ගර්භණී මවක් තාවකාලිකව වෙනත් ප්‍රදේශයකට ගොස් එහිදී ප්‍රසූතිය සිදු කළ විට, එම ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් උපත තාවකාලිකව ලියාපදිංචි කළ යුතුවේ. පසුව එම මව ටික කලකින් වෙනත් ප්‍රදේශයකට (මුලින් සිටි ප්‍රදේශයට නොව) **ස්ථිරව පදිංචියට** ගියේ නම් එම ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් යෝග්‍යතා පවුලක් ලෙස ලියාපදිංචි කර උපත සජීවී උපත් ස්ථිර දෙවනවර කොටසට ගත යුතු වේ.

පිටු අංක - 45 සජීවී උපත් - තාවකාලික

ප්‍රසූතියට පසු තාවකාලිකව පැමිණෙන මව්වරු සඳහා ඔවුන්ට ලබා දෙන තාවකාලික අංකයෙන් සජීවී උපත සඳහන් කරන්න.
උදා: A/X/05

පිටු අංක - 45 ප්‍රසූත - ස්ථිර - පසු ගමන් මගින්

පසු ගමන් කිරීමේදී තම ප්‍රදේශයේ ස්ථිර පදිංචි මව්වරුන් වාර්තා කරන ලද ප්‍රසූත මෙහි සඳහන් කළ යුතු වේ. එමෙන්ම ගර්භණීභාවය ලියාපදිංචි නොකරන ලද මවක් ප්‍රසූතියෙන් පසු තම ක්ෂේත්‍රයට ස්ථිර පදිංචියට පැමිණි විට එම මවගේ ප්‍රසූතයද මවට ලබා දෙන පසු ප්‍රසව අංකයෙන් මේ යටතේ වාර්තා කළ යුතුවේ.

පිටු අංක - 46

- පසුවිපරම් කළ ගණන (සුවනාරි) යන්න **"පසු විපරම් සඳහා ගෘහ පිවිසීම් කළ ගණන"** යනුවෙන් වෙනස් විය යුතුය.

සුවනාරී සායනයෙන් විශේෂඥ සායන වෙත යොමු කළ කාන්තාවන් වෙනුවෙන් පසු විපරම් සඳහා ගෘහ පිවිසිම් කළ ගණන (සියළුම රෝගී තත්ත්වයන් සඳහා) කාන්තාවගේ ලියාපදිංචි අංකයෙන් සඳහන් කරන්න. (මෙම වාක්‍යයේ **මව්වරු** යන්න **"කාන්තාවන්"** ලෙස වෙනස් විය යුතුය.)

- බර කිරීම යටතේ තොරතුරු පහත පරිදි සංශෝධනය වේ.

මෙම වයස් කාණ්ඩ වල බර කිරන ලද දරුවන් ගණන, ඔවුන්ගේ පෝෂණ තත්ත්වය හා අදාල වයස් කාණ්ඩයට අනුව **ප්‍රගණන ලකුණු** වලින් සඳහන් කරන්න. වර්ධනය අඩාල දරුවන් ගණන පෝෂණ තත්ත්වයේ අදාල තිරු වලට ප්‍රගණන ලකුණු වලින් දැම්මට අමතරව "0" තිරුවේද ප්‍රගණන ලකුණු වලින් සඳහන් කරන්න.

උදා :- වර්ධනය අඩාල මධ්‍යස්ථ අඩු බර දරුවා "X" හා "0" යන තිරු දෙකටම ඇතුළත් විය යුතුය.
බර කිරන ලද දරුවන් ගණන යන තිරුවට "N", "X" , "XX", "0W" යන තිරු 4 හි එකතුව පමණක් ගනු ලැබේ.

පිටු අංක - 46, 47

සායනික පැමිණීම

සායනික පැමිණීමට අදාළ කර ගත යුත්තේ තමා භාරයේ සිටින සේවාලාභීන් ගණන පමණි.

- නවක විවාපත් යුවල්

  බහු සායනයට හෝ පූර්ව ගර්භණී සායනවලට පැමිණි නවක විවාපත් යුවල් ගණන

- සුවනාරී/යොමු කළ ගණන

  අළුතින් හඳුනා ගත් රෝගීන් සහ ගැබිගෙළ ශ්‍රාව පටල පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව විශේෂඥ සායන වෙත යොමු කරන ලද රෝගීන් ගණන සටහන් කරන්න.

- පවුල් සැලසුම්

  ක්‍රම අනුව පැමිණි ගණන සඳහන් කරන්න.

  උදා : L – 08, P – 10

දින වැඩ සටහන - සෞ. 523

පිටු අංක - 47

❖ දිනවැඩ සටහන සඳහා අවශ්‍ය තොරතුරු දින පොතෙන් සහ අනෙකුත් අදාළ ලේඛන හා සටහන් වලින් ලබා ගත යුතුවේ.

ගර්භණී මව්වරු/ අඩු අවදානම්

භාරයේ සිටින මව්වරුන්ගෙන් අවදානම් තත්ත්වයක් නොමැති මව්වරු ගණන ගර්භණී මව්වරුන්ගේ ලේඛනයෙන් හෝ ගර්භණී සටහන් පත් මගින් ලබා ගත හැකිය.

ගර්භණී මව්වරු/ වැඩි අවදානම්

භාරයේ සිටින මව්වරුන්ගෙන් අවදානම් තත්ත්වයක් සහිත මව්වරු ගණන ගර්භණී මව්වරුන්ගේ ලේඛනයෙන් හෝ ගර්භණී සටහන් පත් මගින් ලබා ගත හැකිය. අවදානම් බව කලින් කලට වෙනස් විය හැකිය.

පිටු අංක - 48

2. මාතෘ සංරක්ෂණය - ලියාපදිංචි කරන අවස්ථාවේදී

<table>
<tr><td rowspan="4">ප.සෞ.සේ.නි. විසින් ලියාපදිංචි කළ ගර්භණී මව්වරුන්</td><td colspan="2">තම ක්ෂේත්‍රයේ ස්ථිර පදිංචි ගර්භණී මව්වරු (ගර්භණී නාම ලේඛනයේ මුල් කොටසේ ලියාපදිංචි මව්වරු) සහ තම ක්ෂේත්‍රයට වෙනත් ප්‍රදේශයකින් තාවකාලිකව ලියාපදිංචි නොවී පැමිණි මව්වරුද, කාලයට අනුව ඇතුළත් කල යුතුය. (මෙම මව ලියාපදිංචි නොවී පැමිණියද තාවකාලික පදිංචිය සඳහා පැමිණි බැවින් ගර්භණී නාම ලේඛනයේ පිටින් පැමිණි කොටසේ ලියාපදිංචි කළ යුතුය.)</td></tr>
<tr><td>සති 8 ට පෙර</td><td>ගර්භණී නාම ලේඛනයෙන් හෝ ගර්භණී සටහන් පත් මගින් අදාල දිනයට ගර්භයට සති 8ට පෙර ලියාපදිංචි කරන ලද මව්වරු ගණන ගත හැකිය.</td></tr>
<tr><td>සති 8 - 12 දක්වා</td><td>ගර්භයට සති 8-12 දක්වා කාලය තුල ලියාපදිංචි කරන ලද මව්වරු ගණන</td></tr>
<tr><td>සති 12ට පසු</td><td>ගර්භයට සති 12 ඉක්ම වූ පසු ලියාපදිංචි කරන ලද මව්වරු ගණන</td></tr>
</table>

පිටු අංක - 57

ෆෝලික් අම්ලය ලබා ගැනීම

ගර්භණී විමට මාස 3කට පෙර සිට ෆෝලික් අම්ලය ලබා ගත් ගර්භණී මව්වරුන් ගණන	ගර්භණී විමට මාස 3කට පෙර සිට ෆෝලික් අම්ලය ගනිමින් සිටි මව්වරු ගණන සඳහන් කරන්න. මේ පිළිබඳ මවගෙන් විමසා තොරතුරු ලබා ගත යුතුවේ.

පිටු අංක - 58

ප්‍රසූතියෙන් පසු පිටතින් ස්ථිර පදිංචියට පැමිණි මව්වරුන්ගෙන් වාර්තා වූ ප්‍රසූත ගණන	ගර්භණීභාවය ලියාපදිංචි කර පැමිණි	ප්‍රසූතියෙන් පසු තම කොට්ඨාශයට ස්ථිර පදිංචිය සඳහා වෙනත් ප.සෞ.සේ.නි. කොට්ඨාශයක ලියාපදිංචි වී පැමිණි මව්වරු ගණන. මෙම මව්වරුන්ගේ ප්‍රසූත වාර්තා කළ යුත්තේ එම මව්වරු ලියාපදිංචි කළ ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසිනි. උපත සපිවි උපත් ස්ථිර පළමුවර යටතේ වාර්තා කිරීම සහ ස්ථිර ළදරුවක ලෙස ලියාපදිංචිය මෙම ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් සිදු කළ යුතුය.

ගෘහ ප්‍රසූත මාතෘ සංරක්ෂණ සේවාවේ උන්නතිය උදෙසා ගෘහ ප්‍රසූත වාර්තා කිරීම පහත සඳහන් අර්ථ දැක්වීමට අනුව සිදු කළ යුතුවේ. මව රෝහලට **ඇතුළත් කිරීමට / ලියාපදිංචි කිරීමට පෙර** කුමන හෝ ස්ථානයක දරු ප්‍රසූතිය සිදු වූයේ නම් (දරුවා බිහි වූයේ නම්) එය ගෘහ ප්‍රසූතයක් ලෙස වාර්තා කළ යුතු වේ.		

පිටු අංක -59

ප්‍රසූත අවස්ථාව වන විට රුධිර පරීක්ෂණ කර ඇති මව්වරු ගණන යටතේ රුධිර සීනි පරීක්ෂාවේ දී PPBS සහ OGTT/**OGCT** යන පරීක්ෂණ යොදා ගත හැකිය.

පිටු අංක - 60

4. මාතෘ සංරක්ෂණය (ප්‍රථම පසු ප්‍රසව ගමනේදී)
ගර්භණී සමයේ රෝගී තත්ත්වයන් වාර්තා කළ **මව්වරු ගණන :** ප,සෞ.සේ.නි. විසින් ගර්භණී කාලයේදී රෝගී තත්ත්වයන් හඳුනා ගත් අවස්ථාවේදීම ගර්භණී සටහන් පත් (H-512 A **සහ** H-512 – B) හි **දකුණු ඉහළ කෙළවරේ එය සටහන් කළ යුතුය. එසේ හඳුනා ගන්නා** ලද රෝගී තත්ත්ව ප,සෞ.සේ.නි. විසින් දරු ප්‍රසූතියෙන් පසු සිදු කරන පළමු පසු ගමනේදීම දින පොතේ සටහන් කර එදිනම තම දින වැඩ වාර්තාවට **ගත යුතුය.** රෝගී තත්ත්ව තිබූ මව්වරු ගණන සහ රෝගී තත්ත්ව වෙන වෙනම සඳහන් කළ යුතුවේ. එක් මවකට රෝගී තත්ත්ව එකකට වඩා තිබිය හැකිය.එක් වරක් හෝ රෝගී තත්ත්වයක් ඇති බව සනාථ වූ විට පසුව එය නිවැරදි කරන ලද වුවද එය රෝගී තත්ත්වයක් ලෙස වාර්තා කළ යුතුය. තම ප්‍රදේශයේ ස්ථිර හා තාවකාලිකව පදිංචි සියළුම මව්වරුන්ගේ ගර්භණී සමයේ රෝගී තත්ත්වයන් වාර්තා **කළ යුතුවේ.** ❖ **ගර්භණී සමයේ රෝගී තත්ත්වයන් අර්ථ දැක්වීම සඳහා ඇමුණුම 01 බලන්න.**

3. පිටු අංක - 62 මාතෘ සංරක්ෂණය ප්‍රසූත වාර්තාකරණයේදී

ගබ්සා ගණන	දිනට වාර්තා වූ ගබ්සා ගණන සඳහන් කරන්න. (ගර්භයට සති 22 ට පෙර ගබ්සාවකි)	ගබ්සා, මළ උපත් සහ මව් මරණ වාර්තා කළ යුත්තේ තමාගේ ස්ථිර පදිංචි මව්වරුන්, ගර්භණීභාවය ලියාපදිංචි නොකර තාවකාලික පදිංචියට පැමිණි මව්වරුන් සහ ගර්භණීභාවය ලියාපදිංචි නොකර **ප්‍රසූතියෙන් පසු පිටතින් ස්ථිර පදිංචියට පැමිණි** මව්වරුන් යන කාණ්ඩ වලින් පමණි.
මළ උපත් ගණන	දිනට වාර්තා වූ මළ උපත් ගණන (ගර්භයට සති 22 ට පසු මල උපතක් වේ.)	
මව් මරණ ගණන	දිනට වාර්තා වූ මව් මරණ ගණන	

පිටු අංක - 69

අංක 12. වෙනත් ක්‍රියාකාරකම් යටතේ 4වන තීරුව පහත පරිදි වෙනස් විය යුතුය.

සුවනාරී සායන වලින් යොමු කරන ලද කාන්තාවන්, පසු විපරම් කිරීම සඳහා ගෘහ පිවිසීම් කළ ගණන

පිටු අංක - 80 (සායනික පැමිණීමේ ලේඛනය - සෞ. 517)

සායනයට අදාල ක්ෂේත්‍ර වල ස්ථිර හෝ තාවකාලික පදිංචි සියළුම සේවාලාභින්ගේ සායනික පැමිණීම සටහන් කළ යුතුවේ. සායනික පැමිණීම සටහන් කිරීම සඳහා සේවාලාභින් කාණ්ඩ අනුව ලේඛනයේ පිටුවල කොටස් වෙන්කර ඇත. **සායනය ආරම්භයේදීම සේවාවන් ලබා ගැනීමට පෙර සේවාලාභින්ගේ පැමිණීම සටහන් කිරීම අනිවාර්ය වේ.**

පිටු අංක - 84 (සායනික පැමිණීමේ ලේඛනය - සෞ. 517)

පවුල් සැලසුම	ප.සෞ. සේ කේත අංකය	පවුල් සැලසුම් සේවාවන් ලබා ගැනීමට පැමිණෙන සේවාලාභින්ගේ සායනික පැමිණීම අදාළ ප.සෞ. සේ. කේත අංකය යටතේ යෝග්‍යතා අංකය සහ භාවිතා කරන ක්‍රමයට අදාල කේත අක්ෂරය යොදා සටහන් කරන්න. උදා: 1. යෝග්‍යතා අංකය B/80 වන ලුපයක් තැන්පත් කර ඇති ප්‍රතිග්‍රාහිකාවක් සායනයට පැමිණියේ නම් ' B/80- L' ලෙස සඳහන් කරන්න. 2. සායනයට පැමිණි ගිලින පෙති භාවිතා කරන යෝග්‍යතා අංකය B/20 වන ප්‍රතිග්‍රාහිකාවක් සඳහා පෙති පැකට් 2ක් ලබා දුන්නේ නම් " B/20-P (2)" ලෙස සඳහන් කරන්න.
	ප.සෞ. සේ කේත අංකය	
	ප.සෞ. සේ කේත අංකය	
	ප.සෞ. සේ කේත අංකය	

පිටු අංක - 92 (සායනික සේවා සංක්ෂේපය)

ළමා පෝෂණය හා සංවර්ධනය කොටස සම්පූර්ණ කිරීම සඳහා දත්ත "ළමා සෞඛ්‍ය වර්ධන සටහනේ බී" කොටසින් ලබා ගත හැකිය.

පිටු අංක - 99 (අවසාන කොටුව)

යොමු කල ගණන - හඳුනාගත් රෝග තත්ත්ව සඳහා විශේෂඥ සායන සඳහා යොමු කරන ලද මුළු ගණන සටහන් කරන්න.

පිටු අංක - 113 (පවුල් සැලසුම් සටහන සෞ 1153)

ලියාපදිංචි කළ අංකය	නව ප්‍රතිග්‍රාහකයෙක් ලෙස පවුල් සංවිධාන මාසික වාර්තා පොතේ (සෞ : 1200 - ඒ) ලියාපදිංචි කළ අංකය සටහන් කරන්න. කිසියම් ප්‍රතිග්‍රාහකයෙක් භාවිතා කළ ක්‍රමය මාරු කර ප්‍රථම වරට වෙනත් අළුත් ක්‍රමයක් ලබා ගත් විට පවුල් සැලසුම් සටහනේ (සෞ 1153) පරණ ලියාපදිංචි අංකය කපා අළුත් ලියාපදිංචි අංකය සඳහන් කරන්න. කිසියම් ප්‍රතිග්‍රාහකයෙක් **පළමු** වරට නික්ෂේපන භාවිතය සඳහා (සෞ: 1200-ඒ) ලියාපදිංචි කරන ලදි. පසුව එම ක්‍රමය අතහැර නැවත **පළමු** වරට පෙති භාවිතා කරන ලද්දේ නම් පළමු ලියාපදිංචි අංකය කපාහැර අළුත් ලියාපදිංචි අංකය සටහන් කරන්න. ටික දිනකින් එම මව පෙති භාවිතය අතහැර නැවත නික්ෂේපන භාවිතයට ගත්තේ නම් නික්ෂේපන සඳහා මුලින් ලියාපදිංචි කරන ලද අංකයම භාවිතා කළ හැකිය.

පිටු අංක - 127

1. සිටින ජනගහනය

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ සිටින ජනගහනය නාගරික, ග්‍රාමීය සහ වතු ජනගහන ලෙස වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න. නාගරික ජනගහනයට අයත් වන්නේ මහ නගර සභා සහ නගර සභා බල ප්‍රදේශ වලට අයත් ජනගහනයයි.

පිටු අංක - 134

භාරයේ සිටින ගණන

අදාල කාර්තුවේ **අවසාන මාසයේ අගදී** තමා භාරයේ සිටින ගර්භණී මව්වරුන්, පසු ප්‍රසව මව්වරුන්, ළදරුවන් හා පෙර පාසල් ළමුන් සංඛ්‍යාව ඇතුළත් කල යුතුය.

පිටු අංක - 141

1.1 ඇස්තමේන්තු කරන ලද සජීවී උපත් සංඛ්‍යාව පහත පරිදි වෙනස් විය යුතුයි.

කොට්ඨාශයේ ජනගහනය සහ ප්‍රදේශයේ දළ උපත් අනුපාතිකය දන්නෙහි නම් සජීවී උපත් සංඛ්‍යාව ඇස්තමේන්තු කර ගත හැකිය.

$$\text{ඇස්තමේන්තු කරන ලද සජීවී උපත් සංඛ්‍යාව} = \frac{\text{දළ උපත් අනුපාතිකය}}{1000} \times \text{ඇස්තමේන්තු ජනගහනය}$$

පිටු අංක - 147

4.1 පසු ප්‍රසව සංරක්ෂණය යටතේ

දින 6 - 10 ඇතුළත කරන ලද අළුත් පසු ගමන් (මවට අළුත්) ප්‍රතිශතයද ගණනය කල හැකිය.

$$\frac{\text{දින 6 - 10 තුළ කරන ලද අළුත් පසු ගමන් ගණන}}{\text{ඇස්තමේන්තු උපත් ගණන}} \times 100$$

පිටු අංක - 149

6 පෙර පාසල් සහ ළදරු සංරක්ෂණය

6.1 පෙර පාසල් දරුවන්, කුඩා දරුවන් සහ ළදරුවන්ගේ පෝෂණ තත්ත්වය ගණනය කිරීම

ළදරුවන් සහ කුඩා දරුවන් සියළුම දෙනා මාසයකට වරක් ද පෙර පාසල් දරුවන් මාස තුනකට වරක්ද සායනයට හෝ බර කිරන මධ්‍යස්ථානට පැමිණ බර කිරා ගත යුතුය. බර කිරන ලද ප්‍රතිශතයද පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් දැනගත යුතුය.

උදාහරණ :-

$$\text{බර කිරන ලද ළදරුවන්ගේ ප්‍රතිශතය} = \frac{\text{ක්‍රමවත්ව බර කිරන ලද ළදරුවන් ගණන}}{\text{භාරයේ සිටින ළදරුවන් ගණන}} \times 100$$

බර කිරීමෙන් අනතුරුව අඩු බර (<-2SD) ළදරුවන් ප්‍රතිශතය හා උග්‍ර අඩු බර ළදරුවන් (<-3SD) ප්‍රතිශතය පිළිබඳව වැටහීමක් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියට තිබිය යුතුය.

උදාහරණ :-

$$\text{මධ්‍යස්ථ අඩු බර (<-2SD) ළදරුවන්ගේ ප්‍රතිශතය} = \frac{\text{මධ්‍යස්ථ අඩු බර ළදරුවන් ගණන (<-2SD)}}{\text{බර කිරන ලද ළදරුවන් ගණන}} \times 100$$

$$\text{උග්‍ර අඩු බර (<-3SD) ළදරුවන්ගේ ප්‍රතිශතය} = \frac{\text{උග්‍ර අඩු බර ළදරුවන් ගණන (<-3SD)}}{\text{බර කිරන ලද ළදරුවන් ගණන}} \times 100$$

මේ ආකාරයට සියළුම දර්ශක සඳහා අදාල පරිදි ගණනය කිරීමෙන් තම කොට්ඨාශයේ කුමන ආකාරයේ පෝෂණ ගැටළු තිබේද යන්න ප්‍රදේශ අනුව දැනගත හැකිය. එයට අමතරව වසරින් වසර මෙම ප්‍රතිශතවල අඩු වැඩිවීම ද පරීක්ෂා කිරීම වැදගත් වේ.

පිටු අංක - 151

8. සුවනාරි සායනයට පළමු වරට පැමිණි වයස අවුරුදු 35 කාන්තාවන් ප්‍රතිශතය = $\frac{\text{සුවනාරි සායනයට පළමු වරට පැමිණි වයස අවුරුදු 35 කාන්තාවන් සංඛ්‍යාව}}{\text{ඉලක්ක ජනගහනය}} \times 100$

(වයස අවුරුදු 35 ස්ත්‍රී ජනගහනය, **ඇස්තමේන්තු** ජනගහණයෙන් 1% කි.)

පිටු අංක - 153

පහත සඳහන් පේදය නොසලකා හරින්න.

❖ එමෙන්ම මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳව තෙමාසික වාර්තාවට (H 509) අදාල තොරතුරු ඇතුළත් කිරීමට පෙර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් එම තොරතුරු වල නිවැරදි භාවය පිළිබඳව පෞද්ගලිකවම විමසා බැලිය යුතුවේ.